DOI: 10.31357/fhssmst.2011.00036

# පෞරුෂය පිළිබඳ බෞද්ධ ආකල්පය

# සූත්‍ර පිටකය ආශ්‍රිත අධ්‍යයනයක්.

කුඹුකේ චන්දාලෝක හිමි

07 DEC 2011

බෞද්ධ දර්ශනය විෂයය යටතේ ශාස්ත්‍රපති පරීක්ෂණයේ අවශ්‍යතා

සපුරාලීම සඳහා 2011.08.20 දින ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය වෙත

ඉදිරිපත් කරනු ලබන පර්යේෂණ නිබන්ධය.

## අපේක්ෂකයාගේ සහතිකය

මෙම ශාස්ත්‍රීය නිබන්ධය ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආචාර්ය පූජ්‍ය නායිම්බල ධම්මදස්සි හිමියන්ගේ සුපරීක්ෂණය යටතේ මා විසින් සම්පාදනය කරන ලද බවත්, මේ පර්යේෂණය කොටස් වශයෙන් හෝ සම්පූර්ණ වශයෙන් හෝ වෙනත් විශ්වවිද්‍යාලයකට හෝ ආයතනයකට හෝ වෙනත් උපාධියක් හෝ ඩිප්ලෝමාවක් සඳහා ද ඉදිරිපත් නොකරන ලද බවත් සහතික කරමි.

07/12/2011

දිනය

කුඹුකේ චන්ද්‍රාලෝක හිමි

## උපදේශක හිමියන්ගේ සහතිකය

බෞද්ධ දර්ශනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණ අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා කුඹුකේ චන්ද්‍රාලෝක හිමි විසින් ඉදිරිපත් කරනු ලබන මෙම පර්යේෂණ නිබන්ධය මාගේ අධීක්ෂණය හා මගපෙන්වීම යටතේ පිළියෙල කරනු ලැබුවකි. මෙම පර්යේෂණ කෘතිය ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණයේ ඇගයීම් කටයුතු සඳහා ඉදිරිපත් කිරීමට සුදුසු මට්ටමක පවතින බව තවදුරටත් මෙයින් සහතික කරමි.

07/12/2011 ..........................................................

දිනය

මහාචාර්ය

නායිම්බල ධම්මදස්සි හිමිපාණෝ

පරීක්ෂක මණ්ඩලය විසින් නිර්දේශීත සියලු නිවැරදි කිරීම්, සංශෝධන සහ එකතු කිරීම් උපාධි අපේක්ෂකයා විසින් අවසාන නිබන්ධය සඳහා ඇතුලත් කර ඇති බව මෙයින් සහතික කරමි.

07/12/2011 ..........................................................

දිනය

මහාචාර්ය

නායිම්බල ධම්මදස්සි හිමිපාණෝ

## අධ්‍යයනාංශ ප්‍රධාන හිමිපාණන්ගේ නිර්දේශය

බෞද්ධ දර්ශනය විෂයය යටතේ ශාස්ත්‍රපති උපාධිය සඳහා විභාග අංක GS/HU/2167/2003 යටතේ කුඹුකේ චන්දාලෝක හිමියන් විසින්, ''පෞරුෂය පිළිබඳ බෞද්ධ ආකල්පය, සූත්‍ර පිටකය ආශ්‍රිත අධ්‍යයනයක්'' යන මාතෘකාව යටතේ ඉදිරිපත් කරන ලද ස්වාධීන පර්යේෂණ අධ්‍යයන නිබන්ධය ඇගයීම් කාර්යය සඳහා විශ්වවිද්‍යාලයට ඉදිරිපත් කිරීමට සුදුසු බව නිර්දේශ කරමි.

07.12.2011

.............................................................

අධ්‍යයනාංශ ප්‍රධාන හිමිපාණෝ

පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය

අධ්‍යයනාංශ ප්‍රධාන,
පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය,
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය,
ගංගොඩවිල, නුගේගොඩ.

# අනුක්‍රමිකාව


| | | | 
|---|---|---|
| | | පිටු අංක |
| අනුක්‍රමිකාව | | i-iii |
| ස්තුතිය | | iv-v |
| නිබන්ධ සාරාංශය | | vi-vii |
| 1. | පළමු පරිච්ඡේදය-හැඳින්වීම | 1-36 |
| 1.1 | පෞරුෂය හැඳින්වීම | 1-15 |
| 1.2 | සූත්‍ර පිටකය හැඳින්වීම | 15-32 |
| 1.3 | පර්යේෂණ ගැටළුව | 32 |
| 1.4 | පර්යේෂණයේ වැදගත්කම | 32 |
| 1.5 | උපන්‍යාසය | 32 |
| 1.6 | පර්යේෂණ අරමුණු | 33 |
| 1.7 | ක්‍රමවේදය | 33 |
| 1.8 | පරිච්ඡේද ව්‍යුහය | 33-36 |
| 2. | දෙවන පරිච්ඡේදය-පෞරුෂ සංකල්පය පිළිබඳ අර්ථ විග්‍රහය | 37- |
| 2.1 | ගති ලක්ෂණ න්‍යායය | 38-43 |
| 2.2 | මනෝ විශ්ලේෂණවාදී න්‍යායය | 43-67 |
| 2.2.1 | සිග්මන් ෆ්‍රොයිඩ්ගේ මනෝවිශ්ලේෂණවාදී මතය | 44-58 |
| 2.2.2 | කාල් යුංග් ගේ විශ්ලේෂණ මනෝවිද්‍යාව | 58-62 |
| 2.2.3 | ඇල්ෆ්‍රඩ් ඇඩ්ලර්ගේ පෞද්ගලික මනෝ විද්‍යාව | 63-66 |
| 2.2.4 | එරික් ෆ්‍රොම්ගේ පෞරුෂ න්‍යායය | 66-67 |
| 2.3 | සමාජ ඉගෙනුම් න්‍යායය | 68-72 |
| 2.3.1 | කැරන් හෝර්නිගේ පෞරුෂ න්‍යායය | 69-71 |
| 2.3.2 | එරික් එරික්සන්ගේ පෞරුෂ න්‍යායය | 71-72 |

2.4 මානවවාදී න්‍යායය 73-75

2.4.1 කාල් රොජර්ස් 73

2.4.2 ඒබ්‍රහම් මාස්ලෝ 74-75

3. තෙවන පරිච්ඡේදය - පෞරුෂ සංකල්පය පිළිබඳ බටහිර ආකල්පය 76-136

3.1 බටහිර මනෝවිද්‍යාව තුළ පෞරුෂ සිද්ධාන්තය 76-83

3.2 පුද්ගලයා, සමාජය හා සමාජානුයෝජනය 84-102

3.2.1 පුද්ගලයා හා සමාජය 84-87

3.2.2 සංස්කෘතිය, සමාජානුයෝජනය හා පෞරුෂය 88-102

3.3 පෞරුෂය පිළිබඳ නිර්වචන 103-113

3.4 පෞරුෂ සංවර්ධන සාධක 113-128

3.4.1 ආරාත්මක සාධක 114-115

3.4.2 පරිසරාත්මක සාධක 115-119

3.4.3 පවුල 119-125

3.4.4 පාසල 125-128

3.4.5 සම වයස් කණ්ඩායම් 128

3.5 ළමා පෞරුෂ වර්ධනය 129-136

4. සිව්වන පරිච්ඡේදය - පෞරුෂය පිළිබඳ බෞද්ධ ආකල්ප 137-196

4.1 පුද්ගලයා පිළිබඳ බෞද්ධ ආකල්පය 137-146

4.2 බුදුදහම තුළ දැකිය හැකි මනෝවිද්‍යාත්මක පදනම 146-156

4.3 පෞරුෂය පිළිබඳ බෞද්ධ ආකල්පය 156-165

4.4 බුදු දහමේ මූලික ඉගැන්වීම්වලින් හෙළිවන පෞරුෂ දර්ශනය 166-196

4.4.1 චතුරාර්‍ය සත්‍යය 168-170

4.4.2 පටිච්ච සමුප්පාදය 170-174

4.4.3 කර්මය 174-178

4.4.4 ත්‍රි ලක්‍ෂණ 179-182

4.4.5 ත්‍රි ශික්ෂාව 183-189

4.4.6 සත්තිස් බෝධිපාක්ෂික ධර්ම 189-196

5. පස්වන පරිච්ඡේදය - බෞද්ධ චින්තාගත පෞරුෂෝදය සංකල්පය 197-312

5.1 ඉන්ද්‍රිය ඥානය හා පෞරුෂෝදය 197-209

5.2 චිත්තවේග පාලනය හා අනුසය ධර්ම 209-245

5.2.1 චිත්තවේග හැඳින්වීම 210-219

5.2.2 චිත්තවේග පිළිබඳ බෞද්ධ සංකල්පය 219-229

5.2.3 චිත්තවේග පාලනය හා පෞරුෂෝදය 229-237

5.2.4 අනුසය ධර්ම හා සංකල්ප සාධනය 237-245

5.3 මානසික සංවර්ධනය හා පෞරුෂෝදය 245-261

5.3.1 මානසික අවප්‍රමාණතා හා බුදුදහම 246-250

5.3.2 මානසික සංවර්ධනය 250-253

5.3.3 මානසික සංවර්ධනය හා බුදුදහම 253-261

5.4 අභිප්‍රේරණය හා පෞරුෂෝදය 262-276

5.4.1 ප්‍රේරණ වර්ගීකරණය 263-267

5.4.2 අභිප්‍රේරණය පිළිබඳ බෞද්ධ ආකල්පය 267-268

5.4.3 අභිප්‍රේරණය තුළින් ලබාගත හැකි පුද්ගල පෞරුෂෝදය 269-276

5.5 පෞරුෂෝදය පිළිබඳ ධම්මපදානුගත සංකල්ප 276-296

5.6 පෞරුෂෝදය පිළිබඳ බෞද්ධ අදහස් බටහිර මනෝවිද්‍යාත්මක අදහස්වලින් වෙනස්වන ආකාරය 296-312

6. සමාලෝචනය 313-319

7. ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය 320-329

# උපකාරානුස්මෘතිය

- කොළඹ ඇතුළු සල්පිටිකෝරළේ ප්‍රධාන සංඝනායක, ධර්ම කීර්ති ශ්‍රී, කාව්‍ය ප්‍රසාදිනී, ලෝකඥාචාරී, කම්මට්ඨානාචාර්ය ගුරුදේව පූජ්‍ය වැල්මිල්ලේ ශ්‍රී සෝමානන්දාභිධාන නාහිමිපාණන් වහන්සේට,

- ශාස්ත්‍රපති, ප්‍රවීණාචාර්ය, පණ්ඩිත, රත්නාවලි බාලිකා විද්‍යාලයේ ධර්මාචාර්ය ගුරුදේව පූජ්‍ය ගෝනදුවේ සුගතවංස මාහිමිපාණන් වහන්සේට,

- පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආචාර්ය පූජ්‍ය නායිම්බල ධම්මදස්සි මාහිමිපාණන් වහන්සේට,

- පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයේ අංශ ප්‍රධාන, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආචාර්ය පූජ්‍ය මාගම්මන පඤ්ඤානන්ද මාහිමිපාණන් වහන්සේට,

- භූගෝල විද්‍යා අධ්‍යයනාංශයේ, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආචාර්ය පූජ්‍ය පින්නවල සංඝසුමන මාහිමිපාණන් වහන්සේට,

- භාෂා හා සංස්කෘතික අධ්‍යයනාංශයේ, කථිකාචාර්ය, රාජකීය පණ්ඩිත, පූජ්‍ය මීපිටියේ සීලරතන මාහිමිපාණන් වහන්සේට,

- පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයේ කථිකාචාර්ය, ආචාර්ය, රාජකීය පණ්ඩිත පූජ්‍ය මැදගොඩ අභයතිස්ස මාහිමිපාණන් වහන්සේට,

- පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය පූජ්‍ය එළමල්දෙණියේ සාරානන්ද මාහිමිපාණන් වහන්සේට,

- පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයේ සහාය කථිකාචාර්ය පූජ්‍ය කුඩාකත්නෝරුවේ විනීත හිමියන්ට,

- පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයේ සහාය කථිකාචාර්ය පූජ්‍ය පනාමුරේ චන්දිම හිමියන්ට.

- ගෝනදුවේ නන්දසාර පොඩි හාමුදුරුවන්ට,

- පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයේ, දර්ශනය හා මනෝවිද්‍යාව පිළිබඳ මහාචාර්ය ඩබ්.ජී. ඥානදාස පෙරේරා ඇඳුරු තුමන්ට,

- පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයේ බෞද්ධ ශිෂ්ටාචාරය පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කේ.ඒ. වීරසේන ඇඳුරු තුමන්ට,

- පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයේ දර්ශනය හා මනෝ විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය යාපාරත්න වීරසේකර ඇඳුරු තුමන්ට,

- පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයේ බෞද්ධ දර්ශනය පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ජී.ඒ. ගාමිණි රත්න ශ්‍රී මහතාට,

- පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයේ දර්ශනය පිළිබඳ කථිකාචාර්ය අරුණ එස්. වල්පොල මහතාට,

- කළමනාකරණ වාණිජ විද්‍යා පීඨයේ, ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික සහකාර අනුර බමුණුසිංහ මැතිතුමාට,

- පශ්චාද් උපාධි පීඨයේ, මහේෂ් මහත්මාට සහ තුෂාර මහත්මාට,

- පරිගණක අක්ෂර සංයෝජනයෙන් සහය දුන් ලලිත් ටයිප්සෙටින් ආයතනයේ ලලිත් ලක්ෂ්මන් සහ සාමා පුෂ්ප කුමාරි දෙපළට,

## පෞරුෂය පිළිබඳ බෞද්ධ ආකල්ප සූත්‍ර පිටකය ඇසුරින් අධ්‍යයනයක්.

## කුඹුකේ චන්ද්‍රාලෝක හිමි

## නිබන්ධ සාරාංශය


පෞරුෂය හා පෞරුෂ සංවර්ධනය පිළිබඳ වත්මන් ලෝකයේ මනෝ විද්‍යාඥයන්ගේත්, වෙනත් විද්වතුන්ගේත් අවධානය යොමු වී ඇත. එහෙත් ඔවුන්ගේ වැඩි අවධානයක් යොමු වී ඇත්තේ බටහිර මනෝවිද්‍යාව සම්බන්ධයෙනි. පෞරුෂය පිළිබඳව බෞද්ධ මනෝවිද්‍යාවට අනුව විමසා බැලීම කාලීන වැදගත්කමකින් යුක්තය. පුද්ගල හා සමාජ සංවර්ධනය උදෙසාත් සමාජ හා මානව විද්‍යා, අධ්‍යාපන මනෝවිද්‍යාව ආදී සෑම විෂය ක්ෂේත්‍රයකටම එහි ඵලදායීත්වයක් ඇත.

පාලි පිටක ග්‍රන්ථ, අටුවා හා ටීකා ග්‍රන්ථ තුළ පෞරුෂ සංකල්පය වචන රාශියකින් උපුටා දක්වා ඇත. ඒ නිසා බුදු දහම තුළ පෞරුෂ සංකල්පය ඉමහත් වැදගත්කමක් උසුලන බැව් කිවමනාය. එහෙත් පෞරුෂ සංකල්පය පිළිබඳ බෞද්ධ විග්‍රහය, විද්වතුන්ගේ ගැඹුරු අධ්‍යයනයකට ලක් නොවීම අඩුවකි. එනිසා බුද්දහම තුළ පෞරුෂය, පෞරුෂ වර්ධනය හා එහි භාවිතයේ වැදගත්කම අර්ථ විග්‍රහ කොට තිබෙන්නේ කෙසේද යන ගැටලුව පැන නගී. එම ගැටලුව නිරාකරණය කර ගැනීම අපගේ අරමුණයි.

යථෝක්ත අරමුණ සාධනය කර ගැනීම උදෙසා පෞරුෂය පිළිබඳව සංකල්ප අධ්‍යයනයක් සිදුකරන බැවින්, මූලාශ්‍ර පරිශීලනයට අවධානය යොමුකොට ඇත. එහිදී ප්‍රාථමික මූලාශ්‍ර වශයෙන් සූත්‍ර පිටකය අධ්‍යයනය කරනු ලැබේ. පෞරුෂය පිළිබඳ බෞද්ධ විග්‍රහය සූත්‍ර පිටකය පුරාම පුළුල් පරාසයක විවරණය වේ. එසේම පෞරුෂ සංකල්පය අර්ථ විග්‍රහ කරගැනීම සඳහා විශ්ව කෝෂ හා ශබ්ද කෝෂ, පරිශීලනය කරනු ලැබේ. තවද පෞරුෂය පිළිබඳ කරුණු ඇතුළත් ශාස්ත්‍රීය ග්‍රන්ථ හා ශාස්ත්‍රය සංග්‍රහයන් ද ද්විතීයික මූලාශ්‍රයන් වශයෙන් පරිශීලනය කරනු ලැබේ. එසේම අන්තර්ජාල වෙබ් අඩවි පරිශීලනයෙන් ද කරුණු අධ්‍යයනය කරයි.

මෙම ශාස්ත්‍රීය නිබන්ධය පරිච්ඡේද පහකින් සමන්විතය. පළමු පරිච්ඡේදය යටතේ 'පෞරුෂය' යන වචනය කෝෂ ග්‍රන්ථ ආශ්‍රිතව අධ්‍යයනය කිරීම, අධ්‍යයනයේ පසුබිම සාකච්ඡා කිරීම හා සූත්‍ර පිටකය පිළිබඳ සංක්ෂිප්ත අධ්‍යයනයක් කිරීම ද සිදුකරනු ලැබේ.

දෙවන පරිච්ඡේදය යටතේ පෞරුෂ සංකල්පය අර්ථ විග්‍රහ කරනු ලැබේ. එහිදී බටහිර පෞරුෂ විග්‍රහය තුළ සාකච්ඡා කරන ගති ලක්ෂණ න්‍යායය, මනෝ විශ්ලේෂණවාදී න්‍යායය, සමාජ ඉගෙනුම් න්‍යායය හා මානවවාදී න්‍යායය පිළිබඳව අධ්‍යයනය කරනු ලැබේ.

තෙවන පරිච්ඡේදය තුළ පෞරුෂ සංකල්පය පිළිබඳ බටහිර ආකල්පය අධ්‍යයනය කොට ඇත. මෙහිදී විශේෂයෙන්ම පුද්ගලයා සමාජ සංස්කෘතිය තුළ සමාජානුයෝජනය වීමෙහි ලා පෞරුෂයේ කේන්ද්‍රීය බව සාකච්ඡා කරයි. පෞරුෂය පිළිබඳ නිර්වචන අධ්‍යයනයත්, පෞරුෂ සංවර්ධන සාධක ගවේෂණය කිරීමත්, ළමා පෞරුෂ වර්ධනය සමාජය තුළ කේන්ද්‍රීය සාධකයක් වන ආකාරයත් විග්‍රහ කරයි.

සිව්වන පරිච්ඡේදය පෞරුෂය පිළිබඳ බෞද්ධ ආකල්පය විවරණය කිරීම සඳහා වෙන්කර ඇත. බුදුදහම පුද්ගලයා නිර්වචනය කරන ආකාරයත්, බුදු දහමේ මනෝවිද්‍යාත්මක පදනමත්, පෞරුෂය පිළිබඳ බෞද්ධ විග්‍රහයත් මෙහි සාකච්ඡා කරයි. බුදු දහමේ මූලික ඉගැන්වීම් තුළ පෞරුෂ දර්ශනය ප්‍රතියමානනය වෙයි ද යන්න පරීක්ෂා කිරීම ද මෙහිදී සිදු වේ.

පස්වන පරිච්ඡේදය වෙන් වන්නේ බෞද්ධ චින්තාගත පෞරුෂෝදය සංකල්පය විවරණය කිරීම සඳහාය. ඉන්ද්‍රිය ඥානය පෞරුෂය කෙරෙහි බලපාන අන්දම අධ්‍යයනය කෙරේ. එසේම චිත්තවේග පාලනය හා අනුසය ධර්ම අධ්‍යයනය තුළින් මානසික සංවර්ධනයක් ඇතිකොටගෙන පෞරුෂෝදය කරා ළඟාවිය හැකි ආකාරය අවධාරණය කරනු ලබයි. අභිප්‍රේරණය තුළින් පෞරුෂෝදය කරා උත්සුක වීමත්, එමගින් පූර්ණ සංවර්ධිත පෞරුෂයක් සාධනය කරගන්නා ආකාරයත් මෙහි විවරණය වෙයි. බටහිර පෞරුෂ දර්ශනය සමතික්‍රමණය කොට, බෞද්ධ පෞරුෂ දර්ශනය යම් බඳු සුවිශේෂී ආස්ථානයක් ස්පර්ශ කරන්නේ ද යන්නත් මෙම පරිච්ඡේදයේ දී අධ්‍යයනය කරනු ලබයි.

# පළමු පරිච්ඡේදය

# හැඳින්වීම

## 1.1 පෞරුෂය හැඳින්වීම

පෞරුෂය සංකල්පය ලතින් භාෂාවේ Persona යන වචනයෙන් බින්න වූවකි. Persona යන වචනයේ අර්ථය "තමා අන්‍යයන්ට පෙනීයන ආකාරය" යන්න යි. 'නළුවන් පැළඳි වෙස් මුහුණු' යන අර්ථය ද එයින් ගම්‍යමාන වේ. එයට හේතුව වන්නේ පැරණි ග්‍රීක නාට්‍යයන්හි නළුවන් නියෝජනය කරන චරිතයට උචිත වෙස් මුහුණු ඔවුන් පැළඳ සිටීමයි. පැළඳි වෙස් මුහුණට අනුව ඔහු නියෝජනය කරන චරිතයේ ගති ලක්ෂණයන් ප්‍රේක්ෂකයන් මුල පටන්ම හඳුනා ගනු ලබයි. ඉහත දැක්වූ Persona යන ලතින් වදනින් Personality යන ඉංග්‍රීසි වචනය බින්න වී ඇත. Oxford ශබ්දකෝෂයට අනුව Personality යන්නෙන් අදහස් කෙරෙන්නේ "අන් අයට සාපේක්ෂව නිතරම ඔවුන්ගෙන් වෙනස් වී පෙනෙන පුද්ගලයෙකුගේ සුවිශේෂ චරිතය හෝ ගති ලක්ෂණයි." "The various aspects of a person's character that combine to make them different from other people"[1] තවත් අයුරකින් "සාමාජීය වශයෙන් පුද්ගලයෙකු සතු ආකර්ෂණීය ගති ලක්ෂණ' වශයෙන් ද හැඳින්විය හැකිය. "The Qualities of a person's character that make them interesting and attractive".[2]

Oxford ශබ්දකෝෂය එය වඩාත් පැහැදිලි කරමින් දක්වා ඇත්තේ "පෞරුෂය යනු පුද්ගලයා තමන්ගේ චරිතය ඔස්සේ අන් අයට වඩා සුවිශේෂ අනන්‍යතාවක් හෝ ගති ලක්ෂණ පෙන්වීමයි යනුවෙනි".[3] Britanica විශ්වකෝෂය දක්වන අයුරින්, Personality යනු "මනෝ භෞතික ගතිලක්ෂණවල සමස්ත සංගතිය හෙවත් පරිසරයට හා සමාජ කණ්ඩායම්වලට පිළිගත හැකි ආවේණික ගතිලක්ෂණයන් ය. "Unique organization of psychophysical trait or

1 **Oxford Advanced Learner's Dictionary**, Sixth edition, Sally Wehmeier, Michael Ashby, Oxford University Press, 2000, p. 943.

2 - Ibid -.

3 **The Concise Oxford Dictionary**, Ninth Edition, Ed, Della Thompson, Delhi, 1995, P. 1020.

characteristics inherent and acquired that disligngusih each individual and arr observable in his relations to the enironment and to the social group"[1]

මලලසේකර ඉංග්‍රීසි සිංහල ශබ්දකෝෂයේ Personality යන්නට දී තිබෙන පරිභාෂික වචනය වන්නේ ස්වීයත්වය, සියත් බව, පෞරුෂය, පුද්ගල විශේෂත්වය යන ඒවාය.[2] මේ සෑම වචනයක් ම සමාන අර්ථවත් වචන වශයෙන් යෙදී තිබෙන බව පැහැදිලිය. පෞරුෂය යන වචනයට වඩා ස්වීයත්වය යන වචනය තුළ පෘථුල අර්ථයක් ගැබ්වෙන බව ඇතැමුන්ගේ පරිකල්පනාවයි. පෞරුෂය යන්න පුරුෂ පක්‍ෂය පමණක් නියෝජනය කරන නිසා ස්ත්‍රී-පුරුෂ දෙපාර්ශ්වයට ම පොදු වූ ස්වීයත්වය යන්න මෙයට වඩාත් සුදුසු යැයි ඇතැම්හු යෝජනා කරති. එහෙත් අපගේ අධ්‍යයනයේ අරමුණ පෞරුෂය පිළිබඳ බෞද්ධ ආකල්පය විමසා බැලීමයි. එනිසා මෙහිදී ''පෞරුෂය'' යන වචනය යොදා ගැනීම වඩා උචිත ය.

පෞරුෂය යන්නට ශ්‍රී සුමංගල ශබ්දකෝෂය ලබා දී ඇත්තේ 'පුරුෂ ප්‍රමාණය', 'පුරුෂ උස' යන අර්ථයන් ය.[3] ඉංග්‍රීසි පාලි ශබ්දකෝෂයේ Personality යන්නට ලබා දී ඇත්තේ 'පුග්ගලිකත්ත' යන වචනය යි.[4] ශබ්ද කල්පද්‍රැමයෙහි 'පෞරුෂය' යන්නට දී තිබෙන්නේ 'පුරුෂ පරිමාණම්' යන්න යි.[5] ශබ්දසාගර නම් සංස්කෘත ඉංග්‍රිසි ශබ්ද කෝෂයෙහි 'පෞරුෂ' යන්නට දී තිබෙන්නේ 'The measure of a man' යනුවෙනි.[6]

පෞරුෂය යන අදහසට වඩාත් ගැළපෙන පාලි භාෂාවේ පාරිභාෂික ශබ්ද සෙවීමේදී සූත්‍ර පිටකය තුළ 'ආසභ', 'පුරිසථාමො', 'පුරිසපරක්කමො' යන වචන හමු වේ.[7] ආසභ යන්න

---

1 **The New Encyclopeidia**, **Britannica**, Vol. 09.

2 මලලසේකර, ජී.පී, ඉංග්‍රීසි සිංහල ශබ්ද කෝෂය, ඇම්.ඩී, ගුණසේන සහ සමාගම, කොළඹ, 2004, පි. 738.

3 සෝරත හිමි වැලිවිටියේ, ශ්‍රී සුමංගල හිමි හික්කඩුවේ, ශ්‍රී සුමංගල ශබ්දකෝෂය, ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10, 1999.

4 Buddhadhatta, P., **English Pali Dictionary**, Motilal Banasidass pub, Delhi, 1955.

5 රාජ රාධ කාන්තදේව, ශබ්දකල්පද්‍රැම-03, වාරාණසී, 1961.

6 Shabda-Sagara, **Sanskrit-English Dictionary**, Pro race Hayman Nilsons, Mookerioee and Co, Calcutta, 1990.

7 දී.නි. I, සීලක්ඛන්ධ වග්ගය, බු.ජ.ත්‍රි. (සංස්) බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, 2004.
ම.නි. II, මජ්ඣිම පණ්ණාසකය, බු.ජ.ත්‍රි. (සංස්) බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, 2005.
සං.නි, ඛන්ධවග්ග පාළි, බු.ජ.ත්‍රි. (සංස්), බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, 2005.
ඛු.නි, ජාතක පාලි **I**, බු.ජ.ත්‍රි. (සංස්), බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, 2005.

ශ්‍රේෂ්ඨයා යන අර්ථයෙන් ද, පුරිසථාමො යන්න පුරුෂයාගේ ධෛර්යය යනුවෙන් ද, පුරිස පරක්කමො යන්න පුරුෂ වීර්යය යනුවෙන් ද අර්ථ දක්වා ඇත.[1] පාලි-සිංහල ශබ්ද කෝෂයේ 'ආසභ' යන වචනයට දී තිබෙන්නේ 'උත්තම', ශ්‍රේෂ්ඨ, නිර්භීය යන වචනයි.[2] පුරිසථාම යන්නට ලබා දී තිබෙන්නේ 'පුරුෂ වීර්යය', 'පුරුෂ ධෛර්යය' යන අර්ථයන් ය.[3] මෙම වචනාර්ථයන්ගෙන් පුද්ගලයෙකුගේ කායික, මානසික පිහිටීම අර්ථවත් කරන බව පැහැදිලි ය. මෙම සෑම විග්‍රහයකින් ම පුද්ගලයෙකු අන්‍යයන්ට පෙනී යන ආකාරය පෞරුෂය යි යනුවෙන් දක්වන ලද ආස්ථානයන් වඩාත් ඉස්මතු වන බව අවධාරණය කළ යුතුය.

මේ අනුව මුල් යුගයේදී පෞරුෂය යන්නෙන් අදහස් වී ඇත්තේ පුද්ගල බාහිරගත ගතිලක්ෂණ බව පැහැදිළි ය. සාම්ප්‍රදායික ලෙස බලන විට හොඳ පෞරුෂයක් ඇත්තේ කටහඬ, උස, මහත හා බාහිර පෙනුම මත බව පිළිගනු ලැබුවත් මනෝවිද්‍යාත්මක අර්ථයෙන් එය බැහැර කිරීමට සිදු වේ. මන්ද කෙතරම් හොඳ බාහිර පෙනුමක් තිබූවත් යම් පුද්ගලයෙකුට කිසියම් ගැටළුවක් විසඳා ගැනීමට නොහැකිනම් හෝ ගැටළුවකට හෝ කිසියම් අවස්ථාවකට මුහුණදීමට හැකියාවක් නොමැතිනම් හොඳ පෞරුෂයක් තිබිය හැකි බව විශ්වාස කළ හැකි නො වේ.[4]

පෞරුෂය යන්න සිංහලයේ යෙදෙන්නේ තත්සම පදයක් ලෙසිනි. සංස්කෘත ව්‍යාකරණ තුළ 'පෞරුෂ' යන්න 'පුරුෂ+යන්' යනුවෙන් ප්‍රත්‍යාන්ත භාව තද්ධිත පදයක් වශයෙන් යෙදේ. ''පුරුෂස්‍ය භාවඃ පෞරුෂම්'' යනුවෙන් එය නිරුක්ති ගත වේ. පාලියෙහි ද මෙය යෙදෙන්නේ ප්‍රත්‍යාන්ත භාව තද්ධිතයක් වශයෙනි. එහිදී 'පොරිස+ණ' ප්‍රත්‍යන්තව 'පුරිසස්ස භාවො පොරිසං' යනුවෙන් නිර්වචනය වී ඇත. මෙම ව්‍යාකරණ විග්‍රහයේදී 'පෞරුෂ' යන්නෙන් විග්‍රහ වන්නේ ආත්මීය ගතිලක්ෂණයන් ය. නැතහොත් ආත්මීය භාවයකි.

---

1 බුද්ධදත්ත හිමි පොල්වත්තේ, පාලි-සිංහල අකාරාදිය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, 1998.

2 සිරි සුමංගල ස්ථවිර, මඩිතියවෙල, පාලි-සිංහල ශබ්දකෝෂය, ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, 1965, පි. 128.

3 සිරි සුමංගල ස්ථවිර, මඩිතියවෙල, පාලි-සිංහල ශබ්දකෝෂය, ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, 1965, පි. 375.

4 පෙරේරා ඤානදාස, පෞරුෂය හා පෞරුෂ වර්ධනය, සහස්‍ර ප්‍රකාශකයෝ, කොළඹ 10, 2005, පි. 01.

කෙසේ වෙතත් පුද්ගල අනන්‍යතාව තීරණය කරන්නා වූ ආවේණික ගති ලක්ෂණ හා සමස්ත මනෝකායික රටාවන් එක්තැන් වූ සංවිධානාත්මක හැසිරීම් රටාව පෞරුෂය යි යනුවෙන් වඩා පැහැදිලි නිර්වචනයක් මේ සඳහා භාවිතා කළ හැකිය.[1] පෞරුෂය යන සංකල්පය විවිධ විද්වතුන් ඔවුන්ගේ එළඹුම් වලට අනුව විග්‍රහකර ඇති බැව් පෙනී යන කරුණකි. එයට අනුව පෞරුෂය නිර්වචනය කිරීමේදී විද්වතුන් එය සමාජගත කරන ආකාරය අනුව තදීය නිර්වචනයන් ද ගොඩනගා ඇති බව කිව හැකි ය. සාමාන්‍යයෙන් පෞරුෂය පිළිබඳ නිර්වචන කාණ්ඩ දෙකකට අයත් වේ. වොට්සන් (1920) නියෝජනය කරන පළමු කණ්ඩායමට මතුපිටින් නිරීක්ෂණය කළ හැකි බාහිර හා වාස්තවික හැඩහුරුකම් අවධාරණය කරන නිර්වචන අයත් වේ. ඕල්පෝට් (1939) විසින් නියෝජනය කරනු ලබන දෙවන කණ්ඩායමට අයත් නිර්වචන පුද්ගලයෙකුගේ අභ්‍යන්තරික, පුද්ගල බද්ධ අංගය ඇතුලත් කරමින් ඉදිරිපත් කර තිබෙන බව පෙනී යයි.

වත්මන් මනෝවිද්‍යාව තුළ පෞරුෂය (Personality) සංකල්පීය නිර්මාණයක් වශයෙන් ගනු ලැබේ. කෙනෙකුගේ සිතුම් පැතුම් අතරින් ඔහුගේ චර්යාව හඳුනා ගැනීමෙන් එම පුද්ගලයා පිළිබඳව පූර්ව කථනයක් කළ හැකිය. වෙනත් වාස්තවික සිදුවීමක් මෙන්ම පෞරුෂය ද වාස්තවිකව නිර්වචනය කළ යුතු බව ඇතැම් විචාරකයින්ගේ මතය යි. නමුත් එයට අයත් බාහිර අංගයන් මෙන් ම අභ්‍යන්තර අංගයන් පිළිබඳව අවධානය යොමු කරමින් එය නිර්වචනය කිරීම වඩාත් අගනේය.

ජී.ඩබ්. ඕල්පෝට් (1939) විසින් පෞරුෂය පිළිබඳව ඉදිරිපත් කොට ඇති නිර්වචනය සලකා බැලීම මෙතැනදී වැදගත් වේ. ඕල්පෝට්ට අනුව ''පුද්ගලයා සිය පරිසරයට සැකසෙන්නේ අද්විතීය අයුරිනි. ඒ සැකසීම තීරණය කරන මනෝභෞතික පද්ධති පුද්ගලයන් තුළ ගතික ලෙස සංවිධානය වේ. එම ගතික සංවිධානය පෞරුෂය යි.''[2] පෞරුෂය සමාන ලක්ෂණවලින්, හා ස්ථාවර ගුණාංගයන්ගෙන් සමන්විත වූවක් නොව, පෞරුෂයෙහි වෙනස්වීමේ ස්වභාවයක් හෙවත් ගතික ස්වභාවයක් දකගත හැකි බව ඕල්පෝට් අවධාරණය කර ඇත. ඉගෙනුම අනුව මිනිසාගේ චර්යාවන් අවස්ථාවෙන් අවස්ථාවට වෙනස් වේ.

---

1 පෙරේරා ඥානදාස, පෞරුෂය හා පෞරුෂ වර්ධනය, සහසු ප්‍රකාශකයෝ, කොළඹ 10, 2005, පි. 01.
2 Allport, Gorden, **Personality A Psychological Interpretation**, 1939.